# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

# පරීක්ෂක වාර්තාව

AA2 විභාගය - ජූලි 2018

## (AA26) ව්‍යාපාර කළමනාකරණය හා උපාය මාර්ග

(Business Management and strategy)

---

මෙම ප්‍රශ්න පත්‍රය **A, B, C, D** යනුවෙන් කොටස් හතරකින් යුක්තව ප්‍රශ්න 10 කින් සමන්විත වේ. සියලුම ප්‍රශ්න සඳහා උත්තර ලිවීම අනිවාර්ය වේ.

## A - කොටස

(වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න)

### ප්‍රශ්න අංක 01

මෙම ප්‍රශ්නය අනු ප්‍රශ්න 10 කින් සමන්විත වන අතර එකකට ලකුණු 2 බැගින් මුළු ලකුණු 20 කි.

අංක **1.1** සිට අංක **1.5** දක්වා දී ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම සුදුසු උත්තරය තෝරාගෙන, තෝරාගත් උත්තරයට අදාල අංකය පමණක් උත්තර පත්‍රයේ ලිවිය යුතු විය. විෂය නිර්දේශයෙහි බොහෝ කොටස් ආවරණය වන ලෙස සකසා ඇති මෙවැනි ප්‍රශ්න සඳහා උත්තර සැපයීමේදී ලබා දී ඇති කාලය කළමනාකරණය කර ගැනීම පිළිබඳව අයදුම්කරුවන් අවබෝධයෙන් කටයුතු කළයුතු අතරම උත්තර සැපයීමේදී දී ඇති උපදෙස් නිසිපරිදි අවබෝධ කරගෙන උත්තර සැපයීම කළ යුතුය. බොහොමයක් අයදුම්කරුවන් නිවැරදිව උපදෙස් පිළිපැද උත්තර ඉදිරිපත් කර තිබුණද සුළු අයදුම්කරුවන් පිරිසක් අදාල උපදෙස් පිළිපැද නොමැති බව නිරීක්ෂණය විය.

තෝරාගත් ප්‍රශ්නයට අදාල අංකය උත්තර පත්‍රයේ සඳහන් කළ යුතු වුවද සමහර අයදුම්කරුවන් අදාල උත්තර ප්‍රශ්න පත්‍රයේම ලියා තිබූ අවස්ථාද දක්නට ලැබුණි. පහසුවෙන් ලකුණු ලබාගත හැකි මෙම ප්‍රශ්නය සඳහා උත්තර නොලියා ප්‍රශ්න මගහැර තිබූ අවස්ථාද දක්නට ලැබුණි.

1.2 ප්‍රශ්නය සඳහා උත්තර සැපයීමේදී කාර්යයක් කිරීමේදී භාවිත වන මිනිස් මානය (human dimension) පැහැදිලි කරන කළමනාකරණ න්‍යාය නිවැරදිව හඳුනාගැනීමට සැලකිය යුතු අයදුම්කරුවන් සංඛ්‍යාවක් අපොහොසත් විය. මේ සඳහා නිවැරදි උත්තරය වන්නේ "(2) චර්යාත්මක (behavioural) න්‍යාය" ලෙසයි.

1.4 ප්‍රශ්නය සඳහා උත්තර සැපයීමේදී, පාලනයේ (controlling) සීමාවක් (limitation) නොවන්නේ කුමක්දැයි යන්න වෙනුවට සීමාවක් වන්නේ කුමක්දැයි ලෙස තේරුම් ගැනීම නිසා වැරදි උත්තර සපයා තිබුණි. මේ සඳහා නිවැරදි උත්තරය වන්නේ "(3) සේවකයන් විසින් පිළිගැනීම" යන්නයි.

**1.6** සිට **1.10** දක්වා දී ඇති එක් එක් ප්‍රකාශයන් සත්‍ය හෝ අසත්‍යද යන්න ප්‍රශ්න අංකය සමඟ උත්තර පත්‍රයේ ලිවිය යුතු විය. බහුතරයක් අයදුම්කරුවන් මේ සඳහා සාර්ථක උත්තර ඉදිරිපත් කර තිබුණද ඇතැම් අයදුම්කරුවන් විභාගයට පෙර සූදානමක් නොමැතිවීම නිසා හෝ දැනුම නොමැතිවීම නිසා හෝ ලකුණු ලබාගැනීමට නොහැකි වූ අවස්ථා නිරීක්ෂණය විය. තවද ඇතැම් අයදුම්කරුවන් දී ඇති උපදෙස්වලට අවධානය යොමු නොකරමින් උත්තර ඉදිරිපත් කර තිබූ අතර, "සත්‍ය" , "අසත්‍ය" ලෙස සඳහන් කිරීම වෙනුවට (√) , (X) සංකේත යොදා තිබූ අවස්ථාද නිරීක්ෂණය විය. මෙවැනි අඩුපාඩු මගහරවා ගැනීමට නම් අයදුම්කරුවන් මනා සංයමයකින් උපදෙස් අනුගමනය කිරීම අත්‍යවශ්‍ය අංගයකි.

**1.7** සැලකිය යුතු අයදුම්කරුවන් සංඛ්‍යාවක් "මධ්‍යගතකරණය (centralization) යනු හෙන්රි ෆෙයෝල් (Henry Fayol) විසින් හඳුන්වා දුන් කළමනාකරණ මූලධර්මයකි" යන ප්‍රකාශය අසත්‍ය ලෙස දක්වමින් වැරදි උත්තර සපයා තිබුණි. නමුත් මධ්‍යගතකරණය යනු හෙන්රි ෆෙයොල් හඳුන්වා දුන් කළමනාකරණ මූලධර්මයක් බව අයදුම්කරුවන් අවබෝධ කරගත යුතුය.

## B කොටස

මෙම කොටස අනිවාර්ය ප්‍රශ්න පහකින් සමන්විත වූ අතර එක් ප්‍රශ්නයකට ලකුණු 5 බැගින් මුළු ලකුණු 25 කි.

### ප්‍රශ්න අංක 02

විවිධ කළමනාකරණ මට්ටම්වලදී, කළමනාකරුවන් විසින් සංවර්ධනය කරගත යුතු කළමනාකරණ කුසලතා 3 ක් පැහැදිලි කරන ලෙස දක්වා තිබුණි. මෙහිදී කළමනාකරුවන් සංවර්ධනය කරගතයුතු කුසලතා 3 ක් සඳහන් කර එම කරුණු එකිනෙක පැහැදිලි කර තිබුණේනම්, සම්පූර්ණ ලකුණු ලබාගත හැකිව තිබුණි. මෙහිදී ඇතැම් අයදුම්කරුවන් කළමනාකරණ කුසලතා හඳුනා දක්වා නොතිබුණද එහි අන්තර්ගත කරුණු සම්බන්ධ පැහැදිලි කිරීම් දක්වා තිබුණි. ඇතැම් අය කළමනාකරණ කුසලතා නම්කර තිබුණද පැහැදිලි කිරීම් කර නොතිබුණි. කෙසේවුවද බහුතර අයදුම්කරුවන් කළමනාකරණ කුසලතා 3 ක් නම්කර එය සාර්ථකව පැහැදිලි කර තිබූ අතර, රූප සටහන්ද ඉදිරිපත් කරමින් මනාලෙස උත්තර ලියා තිබූ අවස්ථාද දක්නට ලැබුණි. ප්‍රශ්නයෙන් අසා තිබෙන්නේ කුමක්ද යන්න අවබෝධ කරගැනීම වඩා වැදගත් වේ. විවිධ කළමනාකරණ මට්ටම්වලදී කළමනාකරුවන් විසින් සංවර්ධනය කරගත යුතු කළමනාකරණ කුසලතා ලෙස, තාක්ෂණික කුසලතා, මානව කුසලතා සහ සංකල්පනාත්මක කුසලතා දැක්විය හැක.

### ප්‍රශ්න අංක 03

අරමුණක ලක්ෂණ 5 ක් සඳහන් කරන්න යනුවෙන් ප්‍රශ්නය ඉදිරිපත් කර තිබුණි. ප්‍රශ්නයෙන් විමසා ඇත්තේ කුමක්ද යන්න පිළිබඳව නිසි අවබෝධයක් ලබා තිබුණු අයදුම්කරුවන් අරමුණක ලක්ෂණ 5 ක් පමණක් සඳහන් කරමින් මුළු ලකුණු ප්‍රමාණයම ලබාගෙන තිබුණි. අරමුණක ලක්ෂණ 5 කරුණු වශයෙන් සඳහන් කළයුතු වුවත් එම කරුණු දීර්ඝ ලෙස විස්තර කරන ලද අවස්ථාද දක්නට තිබුණි. තවද ප්‍රශ්නයට අදාල නොවන කරුණු ඉදිරිපත් කරමින් කාලය නිකරුණේ වැයකර වැඩි ලකුණු ලබාගැනීමට ඇති ප්‍රශ්න සඳහා යොදාගත යුතු කාලය මෙම ප්‍රශ්නය සඳහා යොදාගෙන තිබුණ අවස්ථාද දක්නට තිබුණි.

### ප්‍රශ්න අංක 04

අධිකාරිත්වය පැවරීමේ වාසි 3 ක් පැහැදිලි කරන ලෙසට ප්‍රශ්නය ඉදිරිපත් කර තිබුණි. ප්‍රශ්නය විමසා ඇති ආකාරයට අධිකාරිත්වය පැවරීම තුලින් සිදුවන වාසි 3 ක් ඉදිරිපත් කර එම වාසිය සිදුවන්නේ කුමන ආකාරයටද යන්න පැහැදිලි කර තිබුණේ නම්, අදාල සම්පූර්ණ ලකුණු ලබා ගැනීමට හැකියාව තිබුණි. බහුතරයක් අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයට සාර්ථකව උත්තර ලියා මුළු ලකුණු ලබාගත් අවස්ථා තිබුණද, ඇතැම් අය කරුණු ලෙස සඳහන් කරමින් විස්තර කිරීම් සිදුකර නොතිබුණි. ඇතැම් අය කළමනාකරණ සංකල්ප මත පදනම්ව අධිකාරිත්වයේ දළ අදහස අවධානයට යොමු කරමින් උත්තර ලියා තිබූ අතර, ප්‍රශ්නයට අදාල නොවන කරුණුද දීර්ඝ ලෙස ඉදිරිපත් කර තිබූ අවස්ථාද නිරීක්ෂණය විය. සඵලදායී කළමනාකරණය, සේවක සංවර්ධනය, සේවක අභිප්‍රේරණය, ව්‍යාපාර සංවර්ධනයට පහසුකම් සැපයීම, කළමනාකරණ ධූරාවලියේ පදනම සකස්කිරීමට හැකිවීම සහ වඩා හොඳ සම්බන්ධීකරණය වැනි කරුණු අධිකාරිත්වය පැවරීමේ වාසි ලෙස දැක්විය හැක.

### ප්‍රශ්න අංක 05

සඵලදායී සන්නිවේදනයක් සඳහා සුදුසු මාධ්‍යයක් තෝරාගැනීමේදී සළකා බැලිය යුතු සාධක 5 ක් හඳුනා දක්වන ලෙස ප්‍රශ්නය ඉදිරිපත් කර තිබුණි. සන්නිවේදනය යනු කුමක්දැයි හඳුනාගෙන එය සාර්ථක කරගැනීම සඳහා සුදුසු මාධ්‍යයක් තෝරා ගැනීමේදී සළකා බැලිය යුතු කරුණු 5 ක් හඳුනාගෙන ඉදිරිපත් කිරීම මුළු ලකුණු ලබා ගැනීමට ප්‍රමාණවත් වේ. බහුතරයක් අයදුම්කරුවන් සඵලදායී සන්නිවේදනයක් සඳහා සුදුසු මාධ්‍යයක් තෝරා ගැනීමේදී සළකා බැලිය යුතු කරුණු සඳහන් කර සම්පූර්ණ ලකුණු ලබාගත් අවස්ථා දක්නට ලැබුණි. එහෙත් ඇතැම් අයදුම්කරුවන් සන්නිවේදනය පිළිබඳ අවබෝධයෙන් තොරව අනවශ්‍ය කරුණු ඉදිරිපත් කර තිබුණි.

සඵලදායී සන්නිවේදනයක් සඳහා සුදුසු මාධ්‍යයක් තෝරාගැනීමේදී සළකා බැලිය යුතු සාධක 5 ක් වෙනුවට සඵලදායී සන්නිවේදනයේ වාසි, සන්නිවේදනයට අදාල වර්ගකිරීම් ආදිය දක්වා තිබූ අවස්ථාද දක්නට ලැබුණි. දීර්ඝ ලෙස විස්තර ඉදිරිපත් කර කාලය වැය කිරීම අනවශ්‍ය වේ. සඵලදායී සන්නිවේදනයක් සඳහා සුදුසු මාධ්‍යයක් තෝරා ගැනීමේදී සළකා බැලිය යුතු සාධක ලෙස පිරිවැය, වේගය, නිරවද්‍යතාවය, පණිවුඩයේ ස්වභාවය, ලබන්නන්ගේ ස්වභාවය, කාර්යයයේ පරිමාණය සහ ප්‍රතිපෝෂණයේ වැදගත්කම වැනි කරුණු දැක්විය හැක.

## ප්‍රශ්න අංක 06

සංස්කෘතිය ජාලයේ මූලිකාංග අතුරෙන්, සංවිධානමය ව්‍යුහය (Organizational Structure) සහ වෘතාන්ත (Stories) පැහැදිලි කරන ලෙස ප්‍රශ්නයෙන් විමසා තිබුණි. මෙම ප්‍රශ්නයට උත්තර පරීක්ෂා කිරීමේදී නිරීක්ෂණය වූයේ සාර්ථක උත්තර දක්වා තිබුනේ ඉතාමත් සීමිත අයදුම්කරුවන් පිරිසක් බවය. කළමනාකරණ අධ්‍යයනයේදී සංවිධානමය ව්‍යුහය ඉතාමත් පහසුවෙන් හඳුනාගතහැකි, පැහැදිලි කළ හැකි මූලිකාංගයක් වුවත් බහුතර අයදුම්කරුවන් අදාල ලකුණු ලබාගෙන නොතිබුණි. ඇතැම් අයදුම්කරුවන් සංවිධානමය ව්‍යුහය රූප සටහන් ඉදිරිපත් කරමින් පැහැදිලි කර උත්තර ඉදිරිපත් කර තිබූ අවස්ථාද දක්නට ලැබුණි.

වෘතාන්ත පිළිබඳවද බහුතරයක් අයදුම්කරුවන් සාර්ථක ලෙස පැහැදිලි කිරීම් ඉදිරිපත් කර නොතිබූ බැවින් ලකුණු ලබා ගැනීම දුර්වල මට්ටමක තිබූ බව අනාවරණය විය. වෘතාන්ත යනු පැරණි සිද්ධීන් සහ ආයතනයට පිටතින් හා ඇතුලතින් ආයතනය පිළිබඳ මිනිසුන් කතාකරන දෑ වේ. ආයතනය විසින් අගයකොට සලකන සහ විශිෂ්ඨ චර්යාවන් ලෙස තේරුම්ගෙන පසුව කවුරුන් සහ කුමක් දිගින් දිගටම පවත්වාගෙන යන්නේද යන්න සංවිධානය විසින් තීරණය කරයි.

## C කොටස

මෙම කොටස සඳහා ප්‍රශ්න අංක 7 සිට 9 දක්වා එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ලබාගතහැකි මුළු ලකුණු ප්‍රමාණය 30 කි.

## ප්‍රශ්න අංක 07

කොටස් දෙකකින් සමන්විත මෙම ප්‍රශ්නයේ **(a) කොටසින්** සම්ප්‍රදායික (බටහිර) කළමනාකරණ ශෛලිය සහ ජපන් කළමනාකරණ ශෛලිය අතර වෙනස්කම් 2 ක් සඳහන් කරන ලෙස දක්වා තිබුණි. මෙම කළමනාකරණ ශෛලීන් දෙක පිළිබඳව අවබෝධයක් ඇති අයදුම්කරුවන් එකිනෙක සසඳමින් වෙනස්කම් දෙකක් සඳහන් කර අදාල ලකුණු ප්‍රමාණය ලබාගැනීමට සමත්ව තිබූ අතර, ඇතැම් අය අනවබෝධයෙන් අදාල නොවන විවිධ වෙනස්කම් ඉදිරිපත් කර තිබූ නමුත් ඔවුන්ට ලකුණු ලබා ගැනීමට නොහැකි විය.  සමහර අයදුම්කරුවන් සම්ප්‍රදායික (බටහිර) කළමනාකරණ ශෛලිය සහ ජපන් කළමනාකරණ ශෛලිය අතර වෙනස්කම් සඳහන් කිරීම වෙනුවට එම ශෛලීන් වෙනවෙනම පැහැදිලි කර තිබූ අවස්ථාද දක්නට ලැබුණි.

මෙම ප්‍රශ්නයේ **(b) කොටසින්, මල්දෙනිය ඉන්ඩස්ට්‍රීස්** සමාගමට මුහුණපෑමට සිදුවිය හැකි නූතන කළමනාකරණ අභියෝග තුනක්(03) පැහැදිලි කිරීම අවශ්‍ය විය. කළමනාකරණ අභියෝග තුනක් සඳහන් කර එක් එක් අභියෝග සමාගමට බලපාන ආකාරය පැහැදිලි කිරීම තුලින් ලකුණු ලබාගැනීමට හැකියාව තිබුණි. බහුතර අයදුම්කරුවන් එසේ කරුණු ඉදිරිපත් කරමින් සාර්ථක උත්තර සපයා තිබුණු අතර, ඇතැම් අය අභියෝග පමණක් නමකර පැහැදිලි කිරීම් සිදුකර නොතිබුණි. තවත් සමහර අයදුම්කරුවන් උත්තර ලිවීම අත්හළ අවස්ථාද දක්නට ලැබුණි. සමස්තයක් ලෙස මෙම ප්‍රශ්නය සඳහා ලකුණු ලබාගැනීම මධ්‍යස්ථ මට්ටමක පැවති බව නිරීක්ෂණය විය. ගෝලීයකරණය, ඉහළ ගුණාත්මකභාවයකින් යුතු නිෂ්පාදිත සහ සේවා සඳහා ඉල්ලුම, ශ්‍රම බලකායේ විවිධත්වය සහ විවිධ සංස්කෘතීන් වැඩිවීම සහ තාක්ෂණයේ අඛණ්ඩ වෙනස්වීම වැනි කරුණු නූතන කළමනාකරණ අභියෝග ලෙස දැක්විය හැක.

## ප්‍රශ්න අංක **08**

මෙම ප්‍රශ්නය කොටස් දෙකකින් සමන්විත වේ. එහි **(a) කොටසින්** සංවිධානයක් සඳහා උපායමාර්ගයක වැදගත්කම විමසන ලෙස ඉදිරිපත් කර තිබුණි. උපායමාර්ගයක වැදගත්කම විමසීමේදී විවිධ පැතිකඩ ඔස්සේ තර්කානුකූලව කරුණු ඉදිරිපත් කිරීමෙන් අනතුරුව උපායමාර්ගයක වැදගත්කම පෙන්වාදිය යුතුය. බහුතරයක් අයදුම්කරුවන් මෙම ප්‍රශ්නය නිසිලෙස අවබෝධ කරගෙන නොමැති බව නිරීක්ෂණය විය. ඇතැම් අයදුම්කරුවන් විවිධ කළමනාකරණ සංකල්ප විස්තර කරමින් අදාල නොවන කරුණු විස්තර වශයෙන් ඉදිරිපත් කර තිබූ බව අනාවරණය වූ අතර, ලකුණු ලබාගැනීමද ඉතාමත් දුර්වල මට්ටමක පැවති බව අනාවරණය විය. එහෙත් ඉතාමත් සීමිත පිරිසක් අදාල කරුණු මැනවින් විමසිලිමත්ව ඉදිරිපත් කර තිබූ බවද හෙළිදරව් විය.

ප්‍රශ්නයෙහි **(b) කොටසින්** උපායමාර්ගික විකල්ප ඇතිකිරීම සම්බන්ධව ඇන්සොෆ් න්‍යාසයෙ (Ansoff matrix) හි ඇතුලත් කර ඇති නිෂ්පාදිත සංවර්ධනය (product development) සහ විවිධාංගිකරණය (diversification) යන උපායමාර්ගික විකල්ප දෙක පැහැදිලි කරන ලෙස දක්වා තිබුණි. මෙම ප්‍රශ්නය සඳහා උත්තර සාර්ථක තත්ත්වයේ නොතිබුණු බව අනාවරණය විය. අයදුම්කරුවන් විභාගයට පෙර සූදානමක් නොමැති බව මැනවින් පිළිබිඹු විය. ඇතැම් අයදුම්කරුවන් තරමක සාර්ථක උත්තර සපයා තිබුණි. ඇතැම් අය පැහැදිලි කිරීමකින් තොරව සාමාන්‍ය අර්ථය දැක්වෙන උත්තර සපයා තිබුණි. සම්පූර්ණ ලකුණු ලබාගත් පිරිස ඉතාමත් සීමිතය. නිෂ්පාදිත සංවර්ධනය යනු දැනට සිටින ගනුදෙනුකරුවන් සඳහා අලුත් නිෂ්පාදිතයක් සංවර්ධනය කිරීම බව අයදුම්කරුවන් විසින් අවබෝධ කරගත යුතුය.

## ප්‍රශ්න අංක **09**

ප්‍රශ්නය කොටස් දෙකකින් සමන්විත වේ. එහි **(a) කොටසින්** සාර්ථක වෙනසක් සඳහා අවශ්‍යවන පරාමිති (parameters) තුනක් පැහැදිලි කිරීම අවශ්‍ය විය. අයදුම්කරුවන්ගෙන් බහුතරයක් ප්‍රශ්නයේ මෙම කොටසට උත්තර ලිවීම අත්හැර දමා තිබූ බව දක්නට ලැබුණි. ඊටහේතුන් ලෙස උපකල්පනය කළ හැක්කේ ප්‍රශ්නය අවබෝධ කර නොගැනීම හෝ මේ පිළිබඳව අධ්‍යයනය නොකිරීම හෝ පරාමිති යන්නෙහි අදහස තේරුම් නොගැනීම යන හේතූන් හෝ ඉන් කුමන කරුණක් හෝ විය හැකිය. ඉතාමත් සුළු පිරිසක් පමණක් කළමනාකරණයේ සාර්ථකත්වයට වෙනසක් අවශ්‍ය බවත් ඒ සඳහා අවශ්‍ය පරාමිති පැහැදිලි කරමින් මුළු ලකුණු ලබාගත් අවස්ථාද දැකිය හැකි විය. සාර්ථක වෙනසක් සඳහා අවශ්‍යවන පරාමිති වන්නේ වෙනසෙහි අවශ්‍යතාව, අනුගත වීම සහ සම්පත් බව අයදුම්කරුවන් අවබෝධ කරගත යුතුය. අදාළ න්‍යායන් පැහැදිලිව දැනගැනීම සහ ඒවා සම්බන්ධ පැහැදිලි කිරීම් නිවැරදිව සිදුකිරීම අත්‍යවශ්‍ය වේ.

මෙහි **(b) (i) කොටසින්** සංවිධානයේ අභ්‍යන්තර ඇල්මැති පාර්ශවයන් දෙකක් හඳුනා දක්වන ලෙසත් මෙහි (b) (ii) කොටසින් සංවිධානයේ මෙහෙයුම් සම්බන්ධයෙන් අභ්‍යන්තර ඇල්මැති පාර්ශවයන්ගේ බලපෑම පැහැදිලි කිරීමත් අවශ්‍ය විය. අයදුම්කරුවන්ගෙන් බහුතරයක්ම මෙම ප්‍රශ්නය සඳහා සාර්ථක උත්තර සපයා ඇති බව නිරීක්ෂණය විය. සංවිධානයක අභ්‍යන්තර ඇල්මැති පාර්ශවයන් (internal stakeholders) ලෙ කොටස්හිමියන් / අයිතිකරුවන්, කළමනාකරුවන් සහ සේවකයන් වැනි පාර්ශවයන් සැලකිය හැකිබව අයදුම්කරුවන් විසින් අවබෝධ කරගත යුතුය.

# D කොටස

(අනිවාර්ය ප්‍රශ්නයකි)

(ලකුණු 25)

## ප්‍රශ්න අංක 10

සිද්ධි අධ්‍යයන ප්‍රශ්නයකි. ඉදිරිපත් කරන ලද සිද්ධියට අදාලව න්‍යායාත්මක කරුණු ගොනුකරන ආකාරය පරීක්ෂා කිරීමට මෙම ප්‍රශ්නය ඉදිරිපත් කර තිබුණි. (a), (b) සහ (c) යනුවෙන් කොටස් 4 කින් ප්‍රශ්නය සමන්විතය.

### (a) කොටස

මෙම කොටසින් සිද්ධියට අදාල **ප්‍රියන්ත මහතා** සහ **ඔස්ටින් මහතා** විසින් අනුගමනය කර ඇති නායකත්ව ශෛලීන් විමසන ලෙස දක්වා තිබුණි. සිද්ධිය පිළිබඳව නිසි අවබෝධයෙන් කියවා ඊට අදාල පුද්ගලයන් දෙදෙනා කටයුතු කරන ආකාරය අනුව ඔවුන් නායකත්ව භූමිකාවේ හැසිරෙන අයුරු සැලකිල්ලට ගෙන විවිධ පැතිකඩ ඔස්සේ පරීක්ෂා කරමින් අනතුරුව ඒ ඒ පුද්ගලයාගේ නායකත්ව ශෛලිය කුමක්ද යන්න හඳුනාගත යුතුය. අයදුම්කරුවන්ගෙන් සැළකිය යුතු පිරිසක් ජනාධිපති නායකත්වය, ප්‍රජාතන්ත්‍රවාදී නායකත්වය යනුවෙන් හඳුනාගෙන අදාල නොවන උත්තර ඉදිරිපත් කර තිබුණි. එහෙත් ඉතාමත් සුළු අයදුම්කරුවන් සංඛ්‍යාවක් පමණක් **ප්‍රියන්ත මහතා** පරිවර්තනීය නායකත්ව ශෛලිය අනුගමනය කරන ලද බව සහ **ඔස්ටින් මහතා** ගනුදෙනුමය නායකත්ව ශෛලිය අනුගමනය කරන ලද බවට දක්වමින් නිවැරදි නායකත්වය ශෛලීන් හඳුනාගෙන විමසා තිබුණි. පුද්ගලයන් දෙදෙනෙක් සිටින නිසා නායකත්ව ශෛලීන් ඉදිරිපත් කළ යුත්තේ දෙකක් පමණි. එබැවින් සිද්ධියට අදාලව එකිනෙකාගේ නායකත්ව ශෛලිය හඳුනාගත යුතුය. ඇතැම් අය නායකත්ව ශෛලීන් කිපයක් සඳහන් කර තිබූ අවස්ථාද දක්නට ලැබුණි. කෙසේවෙතත් ප්‍රශ්නයේ මෙම කොටස සඳහා ලකුණු ලබාගැනීම ඉතාමත් දුර්වල මට්ටමක පැවති බව අනාවරණය විය.

### (b) කොටස

මෙම කොටසින් සිද්ධියට අදාලව ආයතනයට සළකා බැලිය හැකි අභිප්‍රේරණ න්‍යායයන් දෙකක් පැහැදිලි කරන ලෙස දක්වා තිබුණි. මෙහිදී කළ යුත්තේ සිද්ධිය හරියාකාරව කියවා තේරුම්ගෙන සිද්ධියට සම්බන්ධ සංවිධානයට අදාල කරගතහැකි අභිප්‍රේරණ න්‍යායයන් දෙකක් පැහැදිලි කිරීමය. මෙම ප්‍රශ්නයට ලකුණු 12 ක් වෙන්කර තිබූ අතර, උත්තර ලිවීමේදී ප්‍රශ්නයට වෙන්කර ඇති ලකුණු ප්‍රමාණය ගැන සැලකිල්ලට ගෙන උත්තර සැපයීම වැදගත් වේ. එමෙන්ම අභිප්‍රේරණ න්‍යායයන් පැහැදිලි කිරීමේදී උචිත ආකාරයට සිද්ධියට අදාල කරගනිමින් උත්තර සැපයීම අවශ්‍ය වේ. මෙම ප්‍රශ්නයට උත්තර සැපයීමේදී අවශ්‍යතා ධූරාවලි න්‍යාය, ද්විත්ව සාධක න්‍යාය, ERG න්‍යාය, මැක්ලෙලන්ඩ්ගේ අවශ්‍යතා අත්පත්කර ගැනීමේ න්‍යාය වැනි න්‍යායයන් අදාළ කරගත හැක.

### (c) කොටස

මෙම කොටසින් සිද්ධියට අදාල සංවිධානයේ මෙහෙයුම් සඳහා සංස්කෘතිය වැදගත් වන්නේ ඇයිදැයි පැහැදිලි කරන ලෙසට දක්වා තිබුණි. සංවිධානමය සංස්කෘතිය කුමක්ද යන්න අවබෝධයෙන් පැහැදිලි කිරීමත් එය සිද්ධියට අදාල ආයතනයට වැදගත්වන ආකාරය පැහැදිලි කිරීමත් කළ යුතු වේ. සමස්තයක් ලෙස උත්තර ඉදිරිපත් කිරීම සතුටුදායක මට්ටමේ පැවති බව අනාවරණය වූ අතර, බහුතරයක් අයදුම්කරුවන් මේ සඳහා වෙන්කරන ලද ලකුණු වලින් වැඩි ලකුණු ලබාගැනීමට සමත් විය. සංවිධානයක ඒකියභාවය, පක්ෂපාතීත්වය, තරඟකාරීත්වය, මෙහෙයවීම සහ අනන්‍යතාව සඳහා සංවිධානමය සංස්කෘතිය වැදගත්වන බව අයදුම්කරුවන් විසින් අවබෝධ කරගත යුතුය.

\- - -

**<u>අයදුම්කරුවන්ගේ අවබෝධ කර ගැනීමේ මට්ටම සහ කාර්යසාධනය වැඩිදියුණු කර ගැනීම සඳහා සැළකිල්ලට ගතයුතු පොදු කරුණු:</u>**

(1) විෂය නිර්දේශය මුළුමනින්ම අධ්‍යනය කිරීම.

(2) ප්‍රශ්න පත්‍රය ඔබට ලැබුණු පසු එහි දී ඇති උපදෙස් පරික්ෂාකාරීව කියවන්න (ඒ සඳහා අමතර කියවීමේ කාලය ප්‍රයෝජනයට ගත හැක).

(3) අයදුම්කරුවන් අවධානයෙන් ප්‍රශ්නය කිප වතාවක් කියවා අවබෝධ කරගත යුතුය. ප්‍රශ්නය සඳහා ඍජු නිවැරදි උත්තරයක් අපේක්ෂා කර තිබෙන විට අනවශ්‍ය පැහැදිලි කිරීම් සහ විස්තර නොලිවිය යුතුය.

(4) විභාගයේදී කාර්යක්ෂම ලෙස කාලය කළමනාකරණය කරගන්න.

(5) උත්තර පත්‍ර බාරදීමට පෙර ප්‍රශ්න අංකය සහ ඔබේ විභාග අංකය නිවැරදිව ලියා තිබේදැයි දෙවරක් පරික්ෂා කරන්න.

(6) කළ යුතු ක්‍රියා පරික්ෂා ලැයිස්තුව ප්‍රශ්න පත්‍රයටම අමුණා ඇත. වාස්තවික ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළයුතු ක්‍රියාවකින් යුක්ත වේ. එහි දී ඇති අර්ථකථන වලට අනුකූල වෙමින් උත්තර ලියන්න.

(7) අත් අකුරු කියවිය හැකි මට්ටමට තිබීම හා උත්තර වලට ප්‍රශ්න අංක නිසිලෙස යොදා තිබීම ගැන සැලකිලිමත් විය යුතුය.

(8) ඒඒටී ආයතනය මගින් නිකුත් කරන ස්ව-අධ්‍යයන පාඩම්මාලා (Self-study Text) පොත්, යෝජිත උත්තර, ලිපි, සඟරා ආදිය කියවීම අනිවාර්යයෙන්ම කළ යුතුය.

(9) ඔබේ දැනුම වැඩිදියුණු කිරීමට, පසුගිය විභාග වල ප්‍රශ්න පත්‍ර අධ්‍යයනය කර උත්තර ලියා පුහුණු විය යුතුය.

(10) හොඳ සූදානමකින් විභාගය සමත්වීමේ පරම චේතනාව පෙරටුකොටගෙන විභාගයට මුහුණ දීම.

- * * * -